**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**තනතුරු ඇබෑර්තු**

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>තනතුර : සහකාර වැඩ කළමනාකරු (සිවිල්) (මධ්‍යම කළමනාකරණ දෙවන මට්ටම) - MLM 2</u>**

**(අ) යෝග්‍යතාවය**

අදාළ ක්ෂේත්‍රයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT)/ උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (HNDT)/ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) / ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) / ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDET) / ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු ඩිප්ලෝමාව (ED–OUSL)/ City & Guilds ආයතනයේ අවසන් සහතිකය ලබාතිබීම/ විශේෂ ආධුනිකත්ව පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර තිබීම. (අවම වශයෙන් වසර 04 ක පාඨමාලා කාලයක් විය යුතුය.)

**සමඟ**

**පළපුරුද්ද**

අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්ද

**(ආ) වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 2 (MLM 2) |
| ආරම්භක වැටුප | : | රු. 82,505/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,585/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 175,000/= ක් පමණ වේ.

**<u>සටහන</u> :**

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක/ කොට්ඨාශයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය - විධායක අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළුව්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙනසේ **2026-09-23** වන දින හෝ ඊට පෙර <u>ලියාපදිංචි තැපෑලෙන්</u> එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**<u>අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**

Gazette.lk AMBITIONS REALIZED